# භාරතීය හා බටහිර ආධිපත්‍ය

ලෝකයේ කලා කෘතිවල, විද්‍යාවේ ප්‍රවාදවල, දාර්ශනික මතිමතාන්තරවල ආදී සියල්ලෙහි ම සමස්තයක් ලෙස ගත්කල ආධිපත්‍යය දරන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ය. සියළු දැනුම්වල ආධිපත්‍යය ඇත්තේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ය. හොඳ නරක තීරණයවන්නේ ඒ සංස්කෘතියෙහි හා චින්තනයෙහි ය. මෙහි දී හොඳ නරක යනුවෙන් කියැවෙන්නේ සාමාන්‍යයෙන් හොඳ මිනිහා නරක මිනිහා යන අර්ථයෙන් පමණක් නොව, ආචාර ධර්ම, සදාචාරය, සාර්ථක කලාකෘති, පිළිගත් විද්‍යා ප්‍රවාද, ආර්ථික කටයුතු ආදී දහසකුත් එකක් කරුණුවලට සම්බන්ධව ය. කෙටියෙන් කියන්නේ නම් අද අප සිතන ආකාරය, ජීවත්වන ආකාරය, මානව අයිතිවාසිකම් ආදිය තීරණය කරන්නේ ඒ සංස්කෘතියෙහි හා චින්තනයෙහි ය.

අවුරුදු පන්සියයකට පමණ පෙර බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඇරඹි දින සිට සිදුවෙමින් පවතින්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ආධිපත්‍යය ලොව පුරා පැතිරවීම ය. එයට අමතරව කලාපීය වශයෙන් ගත්කල අපට තවමත් වෛදික හින්දු සංස්කෘතියෙහි බලපෑම දැකගත හැකි ය. එබැවින් කලාත්මක කෘතියක් මනින මිම්ම නැත්නම් මිනුම් දඬු අද නිපදවී ඇත්තේ එක්කෝ බටහිර ය. එසේත් නැත්නම් ඉන්දියාවෙහි ය. අද යොදාගන්නා මොන විචාර කලාව ගත්තත් ඒ එකකෝ බටහිර විචාර කලාවක් වෙයි. එසේත් නැත්නම් වෛදික විචාර කලාවක් වෙයි.

අද ලෝකය ගමන්කරන ආකාරය අනුව ඉන්දීය මිනුම් දඬුවලට එතරම් දිගු කාලීන පැවැත්මක් නැත. තව කෙටිකලක් ඉන්දිය, නිවැරදිව කියන්නේ නම් භාරතීය මිනුම් දඬු ඉතිහාසයට හා ඊනියා පැරණි සංස්කෘතියකට පමණක් අයත් දෑ බවට පත්වනු ඇත. අනෙක් ප්‍රාදේශීය මිනුම් දඬුවලට කිසිම තැනක් ලබාගැනීමට නොහැකි වනු ඇත. මෙකල බොහෝවිට හොඳ චිත්‍රපටියක් විය හැක්කේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට හා යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි සංස්කෘතියට සාපේක්‍ෂව ඒ මිනුම් දඬුවලින් මණිනු ලැබුකල හොඳ යැයි කිවහැකි චිත්‍රපටියකට ය. කලාපීය වශයෙන් පමණක් තවමත් ටික කලක් යන තුරු වෛදික හින්දු සංස්කෘතික ආධිපත්‍යයක් ඇත. එහෙත් මෙයින් අදහස් කරන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සදාකාලික ය යන්න නො වෙයි. ඉන් කියැවෙන!නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය නැතිවීමට පෙර වෛදික හින්දු සංස්කෘතියෙහි ආධිපත්‍යය නැතිවන බව ය.

අප මේ සියල්ල සලකන්නේ කුමන්ත්‍රණ ලෙස නො වෙයි. ඇතැමුන්ට අනුව අප කියන්නේ සිංහල බෞද්ධ සංස්කෘතියට එරෙහිව කුමන්ත්‍රණයක් ඇති බව ය. මේ කුමන්ත්‍රණ කතා මුලින් ම කීවෝ ද බටහිරයෝ ය. මාක්ස්වාදීහු කුමන්ත්‍රණ කතාවල කප්පිත්තෝ වෙති. ඔවුන් අදහන (එය ඇදහීමක් මිස අන් කිසිවක් නො වේ) ඉතිහාසයට හා එමගින් පුරෝකථනය කරන අනාගතයට එරෙහිව ක්‍රියාත්මක වන බොහෝ දෑ තම ප්‍රවාදයෙන් තේරුම් කරදීමට නොහැකි වූ කල ඔවුහු ඒවා කුමන්ත්‍රණ ලෙස නම් කරති.

එහෙත් අපි එලෙස නො කියමු. එසේ වුව ද බටහිරයන් අනුකරනය කරන මාක්ස්වාදීහු ද අනෙක් අය ද ඔවුන්ගේ මනස අප වෙත ආරෝපණය කරමින් අප සිංහල බෞද්ධ සංස්කෘතියට එරෙහි කුමන්ත්‍රණ ගැන සිහින දකින බව පවසති. සුළඟ එනු පිණිස ආදී චිත්‍රපටිවලට සම්මාන ලැබෙන්නේ බටහිර කුමන්ත්‍රණයක ප්‍රතිඵල නිසා නොවේ. ඒ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි කරුණු සිද්ධවන ආකාරයයි. අපේ ප්‍රවාද අනුව කරුණු සිද්ධවන්නේ ඒ ආකාරයට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ආධිපත්‍යය පැතිරවීමට ය. එලෙස නොවන්නේ නම් පමණක් අපට ප්‍රශ්නයක් වෙයි. අපේ ප්‍රවාද අනුව කරුණු සිදුවෙමින් පවතින කල අප කුමන්ත්‍රණ පසුපස යා යුත්තේ ඇයි?

කලාපීය වශයෙන් පවතින වෛදික හින්දු සංස්කෘතික ආධිපත්‍යය වුව ද පවතින්නේ තවත් ටික කාලයක් පමණ ය. ඒ ආධිපත්‍යය අවසන්වන දිනය නිශ්චිතව කිව නොහැකි වුව ද, ඒ ටික කලකින් අවසන් වීමට නියමිත ව ඇත. ඉන්පසු සම්පූර්ණයෙන් ම ඇතිවන්නේ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි ආධිපත්‍යයයි. මේ ආධිපත්‍යය පිහිටුවීම සාධාරණයකිරීමට රෙඩ්ෆීල්ඩ් මහතා ඉදිරිපත්කරන ලද මහා සම්ප්‍රදාය හා චූල සම්ප්‍රදාය සංකල්ප හා අදාළ ප්‍රවාදය අද ලොව පුරා පැතිර ගොස් ඇත. අපේ රටේ උගත්තු ද කිසිම වගවිභාගයකින් තොරව මේ සංල්ප හා ප්‍රවාද

© Prof. Nalin De Silva

යොදාගනිති. මේ චූල සම්ප්‍රදාය මහා සම්ප්‍රදාය මෙරටට හඳුන්වාදෙනු ලැබුයේ මහාචාර්ය සරච්චන්ද්‍ර මහතා විසින් ය. මෙරට උගත්තු අපේ මහා සම්ප්‍රදාය භාරතීය සම්ප්‍රදාය යැයි කිසිම ලජ්ජාවකින් තොරව පැවසූහ.

රෙඩ්ෆීල්ඩ් මහතාගේ මහා සම්ප්‍රදාය හා චූල සම්ප්‍රදාය නැතිව වුවත්, විසිවැනි සියවසේ මුල්භාගයේ සිට අද දක්වා ම ඊනියා දේශීය උගතුන් භාරතීය සම්ප්‍රදායට වැඳ වැටෙනු දැකගත හැකි ය. අප දේශීය සංගීතයක් ගැන කතාකිරීමටත්, දේශීය වෙදකම ගැන කතාකිරීමටත් හැරුණේ භාරතය දෙසට ය. පණ්ඩිත වික්‍රමාරච්චි මහතා දේශීය වෛද්‍ය විද්‍යාවක් සඳහා භාරතයට ගියේ ය. අපේ දේශීය සංගීතඥයෝ  අපට දේශීය සංගීතයක් ලබාගැනීම   සඳහා භාරතයට ගියහ. මූලික වශයෙන් ගතහොත් එහි වරදක් නැතැයි කිසිවකුට කිවහැකි ය. එහෙත් එවිට අප විසින් බිහිකිරීමට තැත් කෙරුණු සංගිතය හෝ වෙදකම හෝ වෙනත් යමක් හෝ භාරතීය වීම නො වැළැක්විය හැකි විය.

මෙහි දී සඳහන් කළයුතු කරුණක් වෙයි. මේ උගතුන් භාරතය බලාගියේ සරච්චන්ද්‍ර මහතා ඊනියා චූල සම්ප්‍රදාය හා මහා සම්ප්‍රදාය මෙරටට හඳුන්වාදීමට බොහෝ කලකට පෙර ය. ඔවුන් භාරතය බලා පිටත්ව ගිය අවධියෙහි රෙඩ්ෆීල්ඩ් මහතාවත් චූල සම්ප්‍රදාය මහා සම්ප්‍රදාය ප්‍රවාදය නිර්මාණය කර නොතිබුණි. ඔවුන් එසේ ගියේ කාගේවත් බලපෑමක් නිසා නොව එසේ යා යුතු යැයි ඔවුන් විශ්වාසකළ බැවින් ය. එසේ නම් එයින් කියැවෙන්නේ රෙඩ්ෆීල්ඩ් මහතා නිවැරදි බව නොවේදැයි කිසිවකුට ඇසිය හැකි ය.

මෙරට වෙදකමක් තිබූ බවත් ඒ වෛද්‍ය සම්ප්‍රදාය ඉතා ඈතට විහිදී බවත් බොහෝදෙනාට අමතක වී තිබුණි. සංගීතය සම්බන්ධයෙන් ද ජනගායනා හා ජනසංගීතයක් තිබුණු බව ද අපේ වාද්‍යභාණ්ඩ ගැන පොතපතෙහි සඳහන්වන බව ද ඇතැමුනට අමතක විය. එහෙත් ඒ හුදු ජනසංගීතයක් පමණක් නොවී ද යන්නත් ඒ චූල සම්ප්‍රදායේ ලක්ෂණයක් නොවී ද යන්නත් රෙඩ්ෆීල්ඩ් අනුගාමිකයකුට ඇසිය හැකි ප්‍රශ්න යි. මෙය චූල සම්ප්‍රදාය හා මහා සම්ප්‍රදාය පිළිදබඳ ප්‍රශ්නයක් නොව අපේ සංස්කෘතියෙහි වූ ප්‍රවාද හිඟය පිලිබඳ ප්‍රශ්නයක් විය. අප ප්‍රවාද නිර්මාණය අනුරාධපුර යුගයේ මැදභාගයේ දී නවතා තිබුණි. එහෙත් එහි දී ද කිවයුත්තක් වෙයි  අනුරාධපුර යුගයෙහි පූර්ව අවධියහි දී වුව ද වියුක්ත ප්‍රවාද ගැන අපේ දැඩි අවධානයක් යොමු වී නො තිබුණි. එහෙත් වෛදික බමුණෝ වියුක්ත ප්‍රවාද නිර්මාණැයහි ලා දක්ෂයෝ වූහ.

අපේ සංස්කෘතියෙහි භාරතයෙහි නොතිබූ ලක්ෂණ රාශියක් විය. භාරතය වෛදික වීමට පෙර එහි තිබූ සංස්කෘතිය ද අපේ කලාපයෙහි ශිෂ්ටාචාරයෙහි තවත් සංස්කෘතියක් වූවාට සැකයක් නැත. භාරතය නමින් හැඳින්වෙන ප්‍රදේශය භාරතය වූයේ ම ඒ ප්‍රදේශයට වයඹ දිගින් ආර්යයන් යනුවෙන් හැඳින්වෙන්නන් පැමිණීමෙන් පසුව බව පැහැදිලි ය. ඒ යුරෝපීයයන්ගේ පැමිණීමෙන් පසුව ඒ ප්‍රදේශය ඉන්දියාව වූ ආකාරයට ය. භාරතය ආර්යයන්ගේ ද ඉන්දියාව යුරෝපීයයන්ගේ ද නිර්මාණ විය. අද ඉන්දියාවේ භාරතීය ලක්ෂණ තිබුණ ද ක්‍රමයෙන් ඒ නැතිවී ගොස් ඉන්දියාවක් පමණක් බවට පත්වනු ඇත.

අපේ පැරැන්නන් කෙළේ අපේ සංස්කෘතියට භාරතයෙන් ඇතැම් දෑ අවශෝෂණය කිරීම ය. බුද්ධ ශාසනය පවා එසේ අවශෝෂණය කරනු ලැබුවක් විය. බෞද්ධ සංස්කෘතිය අපේ කලාපයේ අනාර්ය (ද්‍රවිඩ නොවන) සංස්කෘතියෙන් බිහිවූවක් වුව ද ඒ පවා අප ලබාගත්තේ අපේ සංස්කෘතියට ගැලපෙන ආකාරයට ය. බෞද්ධ සංස්කෘතියෙහි ද ඒ ලක්ෂණය ඇත. එනම් මුළු ලෝකයට ම පොදු බෞද්ධ සංස්කෘතියක් ඇතිකිරීමට කිසිවකු කිසිම දිනෙක උත්සාහ දරා නැත. ඒ ඒ රටේ ඒ ඒ ප්‍රදේශයෙහි බුදු සසුන  ඒ ඒ ප්‍රදේශයට සරිලන ආකාරයෙන් සකස්විය යුතු යැයි පිළිගනු ලැබිණි. ඇත්තේ බෞද්ධ සංස්කෘතීන් මිස බෞද්ධ සංස්කෘතියක් නො වෙයි. මෙය මුස්ලිම්, ක්‍රිස්තියානි හා යුදෙව් සංස්කෘතීන්ගෙන් මුළුමනින් ම වෙනස් වෙයි. බටහිර ආසියාවේ බිහි වූ මේ සංස්කෘතී මුළු ලෝකයට ම එකම සංස්කෘතියක් විය යුතු ය යන ස්ථාවරයේ පිහිටියේ ය. මුළු විශ්වයට ම පොදු එකම දෙවියන් වහන්සේ කෙනකු ඇති ඒ සංස්කෘතීන්  ලෝකයට ම පොදු සංස්කෘතියක් ඇතිකිරීමට  උත්සාහගැනීම   පුදුමයට කරුණක් නො වෙයි.

පැරණි සිංහලයන් එසේ වෙනත් සංස්කෘතීන්ගෙන් ඒ ඒ දෑ අවශෝෂණය කළ ද පසුකලෙක ඒ තත්වය වෙනස් වී සිංහලයෝ ක්‍රමයෙන් අනුකාරකයන් බවට පත්වූහ. අද වන විට ඔවුහු සමස්තයක් ලෙස ගත්කල අනුකාරකයෝ ම පමණක් වෙති. මේ අනුකාරකයන් දෙකොටසකට බෙදිය හැකි ය. එක් කොටසක් යුරෝපය හා සෙසු බටහිර ලෝකය

© Prof. Nalin De Silva

අනුකරණය කරන අතර අනෙක් පිරිස භාරතය (ඉන්දියාව නොව) අනුකරණය කරති. ඒ දෙපිරිසම දේශීය දේ හෙළාදකිති. භාරතය අනුකරණය කරන්නන්ට දේශීය සංගීතය හෝ දේශීය වෙදකම හෝ නයාට අඳුකොළ වැනි ය. ඔවුන් දේශීය වශයෙන් සලකන්නේ එක්කෝ ආයුර්වේදය ය, නැත්නම් උත්තර භාරතීය සංගීතය ය. එහෙත් ඉඳහිට ඒ අනුකාරකත්වයට එරෙහිව යන්නෝ ද වූහ. කුමාරතුංග මුනිදාස මහතා ඒ අතර ප්‍රධානියෙක් විය. ඒ මහතාගේ මතිමතාන්තර එකළ විසූ සුනිල් ශාන්ත මහතා ඇතුළු සංගීතඥයන් කිහිප දෙනකුට ම බල පා ඇති බව පැහැදිලි ය.

එහෙත් ඒ සම්ප්‍රදාය දිගින් දිගට ගලාගියේ නැත. එසේ වුවත් අද ජීවත්වන ඇතැම් සංගීතඥයන්ට ද අවිඥානික ව හෝ තනු නිර්මාණයකිරීමේ දී ජනගීවල නාදරටා අනුගමනයකිරීමට සිදු වී ඇති බව පැහැදිලි ය. උත්තර භාරතීය සංගීතයේ පුහුණුව ලැබුව ද ඔවුන්ට ද අපේ නාදරටාවලින් මුළුමනින් ම මිදෙන්නට නොහැකි වීමෙන් පෙන්නුම්කරන්නේ අපේ සංස්කෘතියෙහි ශක්තිය ය. මේ ශක්තිය අපට ධෛර්යයක් අත්පත්කර දෙන්නේ සංගීතයෙහි පමණක් නො වෙයි. සාහිත්‍ය විචාරය සම්බන්ධයෙන් මෙන් ම බටහිර විද්‍යාව සම්බන්ධයෙන් ද ඒ ශක්තිය අපට අනුබලයක් වෙයි.

සාහිත්‍ය විචාරය සම්බන්ධයෙන් ගත්කල මාර්ටින් වික්‍රමසිංහ මහතා අපට දේශීය විචාර ක්‍රමයක් හඳුන්වාදුන් බව කියැවෙයි. එහෙත් ඒ විචාර ක්‍රමය කුමක්දැයි පෙන්වා දිය හැකි අයකු නැත. මාර්ටින් වික්‍රමසිංහ මහතා මෙරට තිබූ සිංහල සංස්කෘතිය භාරතයෙන් අදීන වූවක් බව පෙන්වීමට මහත් උත්සාහයක් දැරී ය. ඒ මහතා භරතය අනුකරණය කිරීමට විරුද්ධ විය. එහෙත් ඒ මහතාගේ විරුද්ධත්වය පැන නැංගේ දේශීය වශයෙන් නොව බටහිර වශයෙන් බව පෙනී යන කරුණකි. ඒ මහතාට අවශ්‍ය වූයේ අපේ සංස්කෘතිය භාරතීය සංස්කෘතිය මෙන් නොව බටහිර සංස්කෘතියේ ඇතැම් අංගවලට සමීප බව පෙන්වීමට ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva